





*ගුරුවරුන් යනු නවෝත්පාදකයන් බිහි කරන ව්‍යවසායකයන් විය යුතු නොවේද ? යන්න මා ප්‍රශ්න කරන්නේ මෙලෙස මාව විවේචනයට ලක්කරනු ලබන අයගෙනි.*

# අයියේ මට ඔයාත් එක්ක ටිකක් කතා කරන්න පුලුවන් ද ?

**මම** මේ හරි බරි ගැසී සූදානම් වනුයේ තරණි ළඟට ගොස් ඇය අසලින් වාඩි වී වීදි නාට්‍ය නැරඹීමටය. එහෙත් එයට ඇය කැමති වේ ද යන්න සිත තුළ ඇත්තේ චකිතයකි. මගේ දුරකථනය නාද විය. ඒ මම මීට පෙර නොදන්නා අංකයෙකිනි. සමහර විට විෂය කරුණක් දැන ගැනීමට පංතියක සිසුවෙකු කතා කරනවා විය හැකි යැයි සිතා මම දුරකථනය Answer කළෙමි. hello කවුද මේ ? අයියේ මම කැම්පස් එකේ 2nd year මල්ලි කෙනෙක්. මට ඔයාව පොඩ්ඩක් හමුවෙන්න පුලුවන් ද ? ඇයි මල්ලි දුරකථනයෙන් කියන්න බැරි දෙයක්ද මම ඇසුවෙමි. එයට වු පිලිතුර වුයේ හමුවෙලාම කතා කරන්න තියෙනවානම් හොඳය යන්නය. මම ඔහුගේ ඉල්ලීම පිළිගත්තේ ය. එහෙත් මගේ සිත තුළ ඇත්තේ නොසන්සුන් බවකි. මොහු මා හමු විය යුතුයි කියන්නේ තරණි ගැනවත් කතා කරන්න ද? ඒ කියන්නේ ඔහුගේ සිතෙත් තරණි පිළිබඳව අදහසක් ඇත්තේ ද? එසේත් නොවේනම් තරණි තමන්ට වඩා පහළ පංතියක සිසුවෙකු සමග සම්බන්ධයක්වත් ඇති කරගෙනවත් ද ? හදවත වෙනදාට වඩා ඉතාමත් වේගයෙන් ගැහෙන්නට විය.

මම වට පිට බැලුවේ ඔහු සමග කතා කරන තුරු සිත නොසන්සුන් බැවින් ඔහු ළඟ එන්නේ ද කියා දැන ගැනීමේ අදහසිනි..මම දුටුවේ එළිමහන් රංගපිටියට පිටතින් සිටින සරසවිය පිරිසිදු කරනු ලබන කාන්තාවන්ය. සරසවිය තුළ ඇති කුණු කසල ඉවත් කිරීම සඳහා මේ අයට මුදලක් ගෙවයි. නිකන් දෙන්නන් කිව්වත් කුණු ටික මිලදී ගන්න කිසිම කෙනෙක් ඉදිරිපත් නොවේ. එයට හේතුව මෙවැනි භාණ්ඩ වලින් කිසිවෙකුට තෘප්තියක් ගෙන නොදෙන නිසාවෙනි. **ශුන්‍ය මිලකදී වුවද සෘණ තෘප්තියක් හෙවත් අනු උපයෝගීතාවයක් ලැබෙන** මෙවැනි භාණ්ඩ ආර්ථික විද්‍යාව තුළ **නීච භාණ්ඩ** ලෙස හඳුන්වයි.

පොඩි මිටි කොලුවෙක් මා අසලට විත් මේ චින්තන අයියා( සරසවිය තුල භාවිතා කරන ලද නාමය භාවිතා විය) නේද යැයි මගෙන් ඇසුවේ මද සිනාවක් පාමිනි. දැන්නම් බිත්තරයක් තම්බාගත හැකි ගානටම හදවත වේගයෙන් ගැහෙයි. ඔව් මල්ලි ඔයාද දැන් ටිකකට කලින් කතා කළේ. මම ඇසුවේ මගේ සිතේ පවත්නා නොසන්සුන් බව ඔහුට නොපෙන්වාය. ඔව් අයියේ මට ඔයාත් එක්ක ටිකක් කතා කරන්න පුලුවන් ද ? ඒ වදනුත් සමග එකක් වෙනුවට බිත්තර කිහිපයක්ම තම්බා ගත හැකි තරමට හදවතෙහි ගැසිම තව තව වේගයෙන් වැඩි විය. බිත්තර යනු පෞද්ගලිත භාණ්ඩයකි. එයට හේතුව කිසියම් කෙනෙක් බිත්තර ගෙඩියකින් බාගයක් අනුභව කළහොත් තව කෙනෙකුට භාවිතා කළ හැකිව තිබූ බිත්තර භාගයක් අඩුවන බැවිනි. එනම් **පාරිභෝජනයේ තරඟකාරීත්වයක් පවතින බවය**. සරසවි පද්ධතිය තුළ මුල්ම අරගලය ඇති වුයේද සරසවි ආපනශාලාව තුළ ලබා දුන් බිත්තරය බිත්තර බෑව දක්වා කප්පාදු කිරීම හේතු කොටගෙනය. මෙම ලක්ෂණයට අමතරව පෞද්ගලික භාණ්ඩයක් වීමට නම් **මිලක් පැවතීම** ද අනිවාර්යය වේ.

පුලුවන් මල්ලි මොකක්ද ප්‍රශ්නය ? මම එසේ ඇසුවේ සිතේ පවත්නා නොසන්සුන් බව තව දුරටත් රැඳවාගෙන සිටීම අපහසු කර්යයක් වන නිසාවෙනි. ප්‍රශ්නයක් නෙමෙයි අයියේ. දැන්නම් සිතට පුංචි සැහැල්ලුවක් දැනේ එත් මුලුමනින්ම සිතේ ගැස්ම පහව යාමට තරම් එම වදන් ප්‍රමාණවත් නොවීය. එහෙනම් කුමක් දැයි මම ඇසුවෙමි. අයියේ අපි පාසලක් තෝරගෙන මේ පාසලේ සහ ඒ අවට පාසල් වල මෙවර A/L විභාගයට මුහුණ දෙන නංගිලා මල්ලිලා වෙනුවෙන් පුංචි සම්මන්ත්‍රණයක් පවත්වන්න අදහස් කරගෙන ඉන්නවා. දැන්නම් සිත තුළ ඇති වූ සතුට කියාගන්නට බැරිතරම්ය. මම සිතු දේ වැරදිය. තරණිට



මම ආදරය කරන බව ඇය දන්න නිසා ඇය වෙන කෙනෙකුට ඇගේ කැමැත්ත නොදෙනු ඇත. මම අනිත් අයව මේ ආකාරයට සැක කිරීම වැරදි යැයි මට හැඟෙයි. එහෙත් මල්ලි මට සමාවෙන්න කියා පැවසිය නොහැකිය. ඔහු කිසිවක් මේ පිලිබඳව නොදනී.

ඉතින් මල්ලි මගෙන් මොනවද වෙන්න ඕනේ ?

අයියේ මම ඔයාත් එක්ක කතා කරලා නැති වුනාට මම ඔයා ගැන අහලා තියෙනවා. ඔයා උගන්නද්දි අහගෙන ඉන්න ආසයිලු. ඔයා ඔයාගේ ජීවිත කතාව නව කතාවකට හරවලා ඒ ඇසුරෙන් විෂයට ප්‍රවේශ වීමක් සිදුකරනවාලු. ඒ වගේම දුරකථනයේ SMS මාර්ග හරහා ඉගන ගන්න අලුත්ම ක්‍රමයක් හඳුන්වලා දුන්නා කියලත් ආරංචියි. මෙසේ මා ගැන මගේම සරසවියේ සහෝදරයෙක් කතා කිරීම සම්බන්ධයෙන් සිත තුළ ඇත්තේ නිහතමානී සතුටකි. එයට හේතුව නවීන තාක්ෂණයේ ක්‍රමවේදයන් වලට හුරුවීමට අකමැති සමහර අය මාව විවේචනයට ලක් කරන විට මගේම මට්ටමේ කෙනෙකු මේලෙස මා ගැන කතා කිරීමයි. **ගුරුවරුන් යනු නව්‍යතාවයන් බිහි කරන ව්‍යවසායකයන් විය යුතු නොවේද ? යන්න මා ප්‍රශ්න කරන්නේ මෙලෙස මාව විවේචනය ලක්කරනු ලබන අයගෙනි.**ඔහු මේ පවසන්න යන්නේ මොනවද යන්න දැන් මට තේරෙයි. ඒ සම්මන්ත්‍රණයේ ආර්ථික විද්‍යා කොටස කරන්න පුලුවන්ද කියලා අහන්නයි මේ සැරසෙන්නේ. ඉතින් මල්ලි මගෙන් මොකක්ද වෙන්න ඕනේ. මම කිසිවක් නොතේරුණාක් මෙන් ඇසුවෙමි.

අයියේ ඔයාට පුලුවන්ද ආර්ථික විද්‍යාව කොටස කරලා දෙන්න. මම දන්න දෙයක් තවකෙනෙකුට කියා දීමට මම කැමැත්තක් දක්වන්නේ පුංචි කාලයෙ සිටමය. හොඳින් ඉගන ගන්නා කෙනෙකුට වචනයකින් හෝ උදව්වක් කරීමට පුලුවන්නම් ඒ තුලින් මම ලබන්නේ ඉමහත් වූ සතුටකි. කිසියම් පුද්ගලයෙකු හොඳින් අධ්‍යාපනය ලබා ගැනීම මත අවශේෂ සමාජයට අත්වන්නේ ද ප්‍රතිලාභයකි. ඒ බැවින් අධ්‍යාපනය යනු පාරිභෝජනයේ ධන බාහිරතාවයකි. **බාහිරතා නිර්වචනය කරනුයේ කිසියම් නිෂ්පාදන හෝ පාරිභෝජන කටයුත්තක් හේතු කොටගෙන එයට සම්බන්ධ නොවන වෙනත් පාර්ශවයකට දැරීමට සිදුවන එහෙත් එයට සම්බන්ධ පාර්ශවය විසින් සැලකිල්ලට නොගන්නා පිරිවැය හා ප්‍රතිලාභ වශයෙනි.**

කරන්න නම් පුලුවන් මල්ලි එත් කවද ද කරන්න හිතාගෙන ඉන්නෙ, සම්මන්ත්‍රණය කිරීමට කැමති වුවද සමහර විට කාලය හරස් වේයැයි මම සිතුවෙමි. අපි මේ මසේ අග වගේ කරන්න හිතාගෙන ඉන්නේ. මෙවැනි උදාර වූ කටයුත්තට කෙසේ හෝ උදව් කළ යුතුයැයි මම තරයේම සිතුවෙමි. සදුදා, අඟහරුවදා දවස් දෙකෙනම් නම් මට පංති මල්ලි. අනිත් දවස්වල නම් මට පුලුවන්. මම එසේ පැවසුවේ සැබවින්ම සදුදා උදේ 8.30 - 12.30 අතර 2016 A/L අලුත් පංතිය යෙදී ඇති නිසාත්. අඟහරුවාදා හවස් භාගයේ 2.15-5.15 අතර 2015 A/L Revision පංතියත් යෙදී ඇති නිසාය. එහෙනම් මම ඔයාට කොල් එකක් දෙන්නම් අයියේ. ඔහු පැයභාගයකට වඩා මාත් සමඟ මේ ගැන කතා කළහ. දැන්නම් විදී න්‍යායාත් අවසාන මොහොතට ලඟා වී ඇත.

තවමත් තරණි කොස් ගස යට වාඩි වී තම මිතුරියන් සමග මොනවාද දොඩවමින් සිටියි. මම පැය ගණනක් ඇය දෙස බලාගෙන උන්නා පමණි වචනයක්වත් කතා කිරීමට නොහැකි විය. සරසවි නේවාසිකාගාරයේ බිත්තියක තිබූ කවි පෙළක් මාගේ සිහියට නැගේ.

විඩාබරින් ඇත හද පිරිලා<br>
වෙහෙසයි නෙතු ඔබ දෙසම බලා<br>
සිහිනයකින් හෝ බිරිඳ වෙලා<br>
ඉන්නකො මගේ මුළු දිවිය පුරා.

එහෙත් තරණි කවදානම් මගේ බිරිඳ වේ විද ? එයනම් සමහර විට සිහිනයක් පමණක් විය හැකිය. මම තරණිට කැමති වුනාට ඇය මා හට කැමතිද කියා දන්නේ නැත. මම අ.පො.ස උසස් පෙළ ලියන කාලයෙදි එක්තරා ගැහැණු ළමයෙක් ගැන මා සිතෙහි අදහසක් තිබුණද එම අදහස ක්‍රියාත්මක කිරීමට නොගියේ මම එසේ කළානම් මගේ අනාගතය විනාශ වන බැවිනි. එසේ වුයේ නම් මම අද සරසවියක ගේට්ටුවක්වත් දකින්නේ නැත.

සරසවිය තුළ ආදරවන්තයින් දකින විට මට පාසල් වයසේ සිටින සමහර ගැහැණු ළමයි, පිරිමි ළමයි ගැන ඇති වන්නේ අනුකම්පාවකි. පාසල් ළමුන් මේ කරන්නේ ඔවුන් විසින්ම ඔවුන්ගේ අනාගතය විනාශ කර ගැනීමක් නොවේ දැයි මට සිතේ. සරසවියට පැමිණි පසු මේ සියල්ල සඳහා පවතින ඉඩ ප්‍රස්තාවන් බොහෝය. පාසල් වයසේ දරුවන් මේ වග තේරුම් ගන්නෙ නම් පාසල් කාලයෙ දි මෙවැනි සම්බන්ධතා වලට පැටලෙන්නේ නැත. ආදරය යනු මානසික අවශ්‍යතාවයකි. ආර්ථික විද්‍යා විෂය තුළ මෙවැනි



අවශ්‍යතා ගැන කතා කරන්නේ ද නැත. 2005 වර්ෂයේ අ.පො.ස. උ පෙළ විභාගයේ අවශ්‍යතා නිර්වචනය කර තිබුණේ **මිනිසෙකු වශයෙන් ජීවත් වීමේ දී සපුරා ගත යුතු අවම දෑ වශයෙනි. මේම අවශ්‍යතා සපුරා ගැනීමට යොදාගනු ලබන විවිධ ක්‍රම, ආකාර හා ස්වරූපයන් වුවමනා ලෙස දක්වා තිබුණි.**

මම තරණි අසලට ඇදි යන්නේ අවුරුදු උත්සවය අවසන වීමට පෙර ඇය සමඟ පුංචි වචනයක් හෝ කතා කළ යුතු යැයි යන අදහස ඇතිවය.

01 ව්‍යවසායකත්වයේ විශේෂිත කාර්යය කවරේ ද ?
i. නිෂ්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස කළමනාකරණය.
ii. ව්‍යවසායේ නිෂ්පාදන සැලැස්ම ක්‍රියත්මක කිරීම.
iii. කුමක්, කෙසේ නිපැදවිය යුතු ද යන තීරණ ගෙන සාධක සේවා ලබාගෙන ඒ තීරණ ක්‍රියාත්මක කිරීම.
iv. නිෂ්පාදනයේ අවදානම් වලට මුහුණ දීම.

02 නිෂ්පාදනයේ **බාහිරතා** යන්නට ඇතුළත් කළ හැකි දෑ හඳුනාගන්න.
i. නිෂ්පාදකයින්ට පාලනය කළ නොහැකි නියගයක් වැනි බාහිර සාධක.
ii. නිෂ්පාදකයින්ට දැරීමට සිදු නොවන එහෙත් සමාජය මත පැටවෙන පිරිවැය.
iii. නිෂ්පාදකයින්ට නොලැබී වෙනත් අයට අත්වන නිෂ්පාදනයේ වාසි.
iv. අපනයන වෙළෙඳපොළවල ව්‍යාපාරික කටයුතු සඳහා දැරීමට සිදුවන පිරිවැයි

03 ශුද්ධ පොදු භාණ්ඩයක නෛසර්ගික ලක්ෂණයක් වන්නේ,
i. ආවස්ථික පිරිවැයට වඩා අඩු මිලකට රාජ්‍ය අංශය මගින් පමණක් සපයන ලබන භාණ්ඩයක් වීමයි.
ii. වෙළෙඳ පොළ මිලට වඩා අඩු මිලකට පෞද්ගලික අංශය මගින් පමණක් සපයනු ලබන භාණ්ඩයක් වීම.
iii. වෙළෙඳපොළ මිලට වඩා අඩු මිලකට පෞද්ගලික හා රාජ්‍ය අංශය මගින් සපයනු ලබන භාණ්ඩයක් වීමයි.
iv.එක් අයෙකුගේ පාරිභෝජනය නිසා අන් අයගේ පරිභෝජනය අහිමි නොවන භාණ්ඩයක් වීමයි.
v. නිෂ්පාදනයේ දී ආවස්ථික පිරිවැයක් දැරීමට සිදු නොවන භාණ්ඩයක් වීමයි.

04 ශුද්ධ පොදු භාණ්ඩයකට උදාහරණයක් වනුයේ,
i. ජාතික ආරක්ෂාව
ii. පාන් ගෙඩියක්
iii. අධ්‍යාපනය
iv. රූපවාහිනී යන්ත්‍රණයක්
v.මහාමාර්ගයක්

05 පොදු භාණ්ඩ පිළිබඳ ව සලකා බැලීමේ දී "පාරිභෝජනයේ තරඟකරිත්වයක් නොමැත වීම" යන්නෙන් අදහස් කෙරෙනුයේ,
i. එම භාණ්ඩය එක් ඒකාධිකාරී නිෂ්පාදකයකු විසින් සපයනු ලබන බව ය.
ii. එම භාණ්ඩය එක් පුද්ගලයෙකු පරිභෝජනය කළ විට, අනෙක් අයට පරිභෝජනය කිරීමට ලැබෙන ප්‍රමාණයෙහි අඩුවීමක් නොවන බව ය.
iii. භාණ්ඩය සඳහා ගෙවීමක් නොකරනු ලබන පුද්ගලයන් පරිභෝජනයෙන් වළක්වාලිය නොහැකි බව ය.
iv. එක් පුද්ගලයෙකු සඳහා එම භාණ්ඩය සැපයු විට අන් අයට ද එය සැපයීමට සිදු වන බව ය.
v. එම භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගනු ලබන සම්පත් වෙනත් භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගත නොහැකි වන බවය.



01 වෙළෙඳ පොළ බලවේග විසින් සලකනු ලබන්නේ නිෂ්පාදනයේ සහ පරිභෝජනයේ පෞද්ගලික පිරිවැය හා පෞද්ගලික ප්‍රතිලාභ පමණි.

i. නිෂ්පාදනයේ හා පරිභෝජනයේ වෙනත් පිරිවැය හා ප්‍රතිලාභ පවතී ද? එබඳු පිරිවැය හා ප්‍රතිලාභ පිළිබඳ එක් නිදර්ශනය බැගින් නිෂ්පාදනයෙන් හා පරිභෝජනයෙන් සපයන්න.

ii නිෂ්පාදනයේ බාහිරතා යනුවෙන් කුමක් අදහස් වේ ද ?

02 ශුද්ධ පොදු භාණ්ඩයක් යනු කුමක් ද? ( සටහන්- පෞද්ගලික භාණ්ඩයක ප්‍රතිවිරුද්ධ ස්වරූපය පොදු භාණ්ඩයක් බව සලකන්න)

03 බාහිරතා යන්නෙන් කුමක් අදහස් වේ ද?

04 ධන බාහිරතා සහිත ආර්ථික ක්‍රියාවන් දෙකක් සඳහා උදාහරණ සපයන්න.

05 පහත සඳහන් එක් එක් දෑ සඳහා උදාහරණය බැගින් දෙන්න.

i) පරිභෝජනයේ දී තරඟකරීත්වයක් සහිත මුදල් ගෙවීමේ හැකියාවක් ඇති අයට පමණක් පරිභෝජනය සීමා කළ හැකි භාණ්ඩයක්

ii) පරිභෝජනයේ දී තරඟකරීත්වක් නොමැති එහෙත් මුදල් ගෙවීමේ හැකියාවක් ඇති අයට පමණක් පරිභෝජනය සීමා කල නොහැකි භාණ්ඩ.

06 අවශ්‍යතා සහ වුවමනා අතර වෙනස දක්වන්න.

07.“ව්‍යවසායකත්වය” යන්න නිර්වචනය කරන්න.

08. ව්‍යවසායකයාගේ ප්‍රධාන කාර්යයන් නම් කරන්න.

09. පෞද්ගලික භාණ්ඩයක දැකිය හැකි ලක්ෂණ කවරේ ද ?

10. වෙළෙඳපොළ ආර්ථිකයක් මගින් පෞද්ගලික භාණ්ඩ පමණක් සැපයීමට වැඩි කැමැත්තක් දක්වනනේ මන්ද ?

